අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

12 , 13 ශ්‍රේණි

# නර්තනය

## විෂය නිර්දේශය

(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## 1.0 හැඳින්වීම

දීර්ඝ කාලයක් තිස්සේ පාසල් පරිසරයෙහි හැදෙන වැඩෙන ශිෂ්‍යයා දැනුම, ආකල්ප, කුසලතා හා යහපත් ජීවන පුරුදු මෙන් ම උසස් රසඥතා ඥානයකින් සහ මානව හිතවාදී චින්තනයෙන් යුතු පුද්ගලයකු වශයෙන් ක්‍රියාකාරී වැඩ ලෝකයට හැඩගස්වාලීම අධ්‍යාපන ක්‍රියාවලියෙහි නියුක්ත සැමගේ වගකීම වේ.

අ.පො.ස (උසස් පෙළ) නර්තන විෂය සැලසුම් කිරීමේ දී උක්ත කරුණ සහ විෂය සුවිශේෂතාව සැලකිල්ලට ගෙන දේශීය සංස්කෘතික හර පද්ධතීන් හඳුනාගැනීම, අගය කිරීම, ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම මෙන් ම අන්‍ය සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම, අගය කිරීම සහ ජාත්‍යන්තර තලයේ දී නොසැලී කටයුතු කිරීම සඳහා අවශ්‍ය විෂයානුබද්ධ පුද්ගල ශක්‍යතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කොට විෂය සන්ධාරය සැලසුම් කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අනුව අ.පො.ස (උ.පෙළ) නර්තන විෂය නිර්දේශය සැලසුම් කර ඇති අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඊට අනුකූල ව සකසා ඇත.

මෙතෙක් පැවති විෂය නිර්දේශයෙහි රසාස්වාදය, නිර්මාණ, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, සිද්ධාන්ත හා සංස්කෘතික පසුබිම යටතෙහි ගොනු කොට තිබූ විෂය කරුණු මින් ඉදිරියට හඳුනාගත් නිපුණතා 6 ක් සාක්ෂාත්කරණය සඳහා 12 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 19 ක් සහ 13 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 16 ක් යටතේ පෙළගස්වා ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපා සැලසුම් කිරීමේ නිදහස ගුරුවරයාට ඇති අතර, එහිදී පරිණාමන ගුරු භූමිකාව අවධාරණය කරනු ලැබේ. අපේක්ෂිත ඉගෙනුම් ඵල සාක්ෂාත්කරණය හා සිසු ප්‍රවීණතා මට්ටම පිළිබඳ ව ගුරු-සිසු දෙපක්ෂය ම දැනුවත් විය යුතු ය. ඒ සඳහා නිසි පරිදි තක්සේරුකරණය හා ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමත් සිසු සංවර්ධනය සඳහා ප්‍රතිපෝෂණය සහ ඉදිරි පෝෂණය සැලසුම් කිරීමත් ගුරු කාර්යභාරය වේ.

අ.පො.ස (උ.පෙළ) නර්තන නව විෂය නිර්දේශය 2009 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත වේ. ඒ අනුව 12 වන ශ්‍රේණිය 2009 වසරේදීත්, 13 වන ශ්‍රේණිය 2010 වසරේදීත් ක්‍රියාත්මක කෙරෙන අතර වැඩිදුර උපදෙස් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් තවදුරටත් ඉදිරිපත් කරනු ලැබේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

1. නර්තන විෂය හා බැඳි ක්‍රියාකාරකම් මගින් අනාගත වැඩ ලෝකයට මුහුණදිය හැකි ක්‍රියාකාරිත්වය මෙන් ම සමාජයෙහි උසස් ජීවන තත්ත්වයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය සාමාජයීය සහ පෞද්ගලික හැකියා වර්ධනය කරගැනීම.

2. උසස් නිමාවකින් යුත් නර්තන කලා කෘති බිහිකිරීම සඳහා මෙන් ම ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු නිර්මාණශීලී ව විසඳාගැනීම සඳහා අවශ්‍ය නිර්මාණාත්මක චින්තනය සහ නිර්මාණ කුසලතා සංවර්ධනය කරගැනීම.

3. දේශීය නර්තනය හා බැඳි සංස්කෘතිකාංග හා විදේශීය නර්තන හා බැඳි සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය මගින් විවිධ සංස්කෘතීන් අගය කිරීම මෙන් ම ජාත්‍යන්තර සමාජයේ දී දේශීය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම පිළිබඳ උදාර හැඟීම් සහ හැකියා ප්‍රදර්ශනය කිරීම.

4. විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරෙන වැඩසටහන් අතුරින් ගුණාත්මක වැඩසටහන් තෝරා ගැනීම , රස විඳීම සහ ජීවිතයේ විවිධ අවස්ථාවන් හි දී නිවැරදි තීරණ ගැනීමේ දී තර්කානුකූල ව හා විචාරාත්මක ව කටයුතු කිරීම.

5. නිරන්තර වෙනස්වන ලෝකයට අනුගත වෙමින් දේශීය සංස්කෘතික හර පද්ධතීන් අනාගත සමාජයට උරුමකර දීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කරගැනීම.

විෂය නිර්දේශය පාසල් වාරවලට බෙදා දැක්වීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද |
|---|---|---|---|
| 12 ශ්‍රේණිය | 1 වාරය | 1.1, 1.3, 1.4, 2.1, 2.4, 3.1, 4.1, 4.2, 4.3, 4.4, 5.2, 6.1 | 108 |
| | 2 වාරය | 1.1, 1.2, 1.3, 1.4, 2.2, 2.4, 3.3, 4.1, 4.2, 4.3, 5.1 108 | 96 |
| | 3 වාරය | 1.1, 1.2, 1.3, 1.4, 2.3, 3.2, 4.1, 4.2, 4.3, 6.2 | 96 |
| 13 ශ්‍රේණිය | 1 වාරය | 1.1, 1.2, 1.3, 1.4, 2.2, 3.1, 3.2, 4.2, 4.4, 5.2, 6.1 | 102 |
| | 2 වාරය | 1.1, 1.2, 1.3, 1.4, 2.2, 3.2, 4.3, 4.4, 5.1, 5.2, 6.2 | 102 |
| | 3 වාරය | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 2.2, 4.1, 4.3, 4.4, 5.1, 6.2 | 96 |

## 3.0 විෂය නිර්දේශය
### 3.1 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීය ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 1.1 සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | **උඩරට නර්තන සම්ප්‍රදාය** | |
| | | • වන්නම් - කිරලා, උදාර, ගජගා | 16 |
| | | • වට්ටම් - කුදංත ගත දොං වට්ටම, දොං ජිංත ගත දොංත වට්ටම පද හතරක් කස්තිරම් අඩව් සමඟ | 14 |
| | | • මංගලම් නර්තනය | 10 |
| | | • කොතල පදය | 10 |
| | | **පහතරට නර්තන සම්ප්‍රදාය** | |
| | | • සින්දු වන්නම් - අනුරාගදණ්ඩ තාලය, ලලිතරාග තාලය, නළු ගීතිකා තාලය | 12 |
| | | • ගුඳ ගති ගත වට්ටම සම්පූර්ණයෙන් | 08 |
| | | • දෙතාලය, තුන්තාලය, නඩන්දූව | 10 |
| | | • ගිරිදේවි | 10 |
| | | • කොතල පදය | 10 |
| | | **සබරගමු නර්තන සම්ප්‍රදාය** | |
| | | • වන්නම් - මණ්ඩුක, කිඳුරු, ආනන්ද | 16 |
| | | • පට්ටුතාල මාත්‍රය , යක් පද මාත්‍රය - ගායනය සහිත ව කලාසම් අඩව් සමඟ | 14 |
| | | • මුල් මාත්‍රය | 10 |
| | | • කෙණ්ඩි පාළිය | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.2 නර්තනය හා බැඳි තාල ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | • ප්‍රස්තාරකරණය - ඉගෙන ගන්නා නර්තන හා ගායන | 16 |
| | 1.3 නර්තනය හා බැඳි ගායනා නියමිත නාදමාලාවන්ට අනුව ඉදිරිපත් කරයි. | • ඉගෙන ගන්නා නර්තන හා බැඳි ගායනා<br>• ප්‍රශස්ති, හටන්කවි, උඩැක්කි කවි, පන්තේරු කවි, මල්යහන් කවි, සිරසපාද කවි, ග්‍රහපන්ති කවි, සොකරි කවි, කෝළම් කවි, පතල් කවි, ගොයම් කවි, නෙළුම් කවි, රබන් කවි. | 14<br>14 |
| | 1.4 වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම භාවිත කරමින් වාදන ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | • සතර බීජාක්ෂර , බෙර/ දවුල් සරඹ පද 1- 3 දක්වා<br>• වන්නම් හා සින්දු වන්නම්වල මූලික බෙර / දවුල් පද අලංකාර පද (ගායනය සහිතව) කස්තිරම්/ කලාසම්/ඉරට්ටි | 10<br>14 |
| 2.0 නර්තනය හා බැඳි මූලධර්ම සහ සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි. | 2.1 දේශීය නර්තන සම්ප්‍රදායයන් හා බැඳි තාල ලක්ෂණ විග්‍රහ කරයි. | • දේශිය නර්තන සම්ප්‍රදායයන් හා බැඳි තාල තනි තිත, දෙතිත, සිව් තිත, පස් තිත, මාත්‍රා, සඳැස්මත්, ගීමත් | 06 |
| | 2.2 රස භාව සංකල්පය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි. | • නව රසය | 06 |
| | 2.3 සතර අභිනය හා දේශීය නර්තන සම්ප්‍රදායයන්ගේ සහසම්බන්ධතාවය අධ්‍යයනය කරයි. | • සතර අභිනය සහ දේශීය නර්තන සම්ප්‍රදායයන්හි නර්තනය, ගායනය, වාදනය, යක්කම්, රටයකුමේ නානුමුරය, සන්නි | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.4 නර්තනය හා සම්බන්ධ රංග වින්‍යාසය පිළිබඳව අවබෝධයෙන් යුතු වකටයුතු කරයි. | • ශරීරාවබෝධය සහ අවකාශ භාවිතය<br>අංග, ප්‍රත්‍යංග, උපාංග<br>දිසා, තල, රටා, මෝස්තර, සම්බන්ධතා | 12 |
| 3.0 විවිධ අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන කලාකෘති නිර්මාණය කරයි. | 3.1 පරිසරයේ සංසිද්ධීන් නර්තන මාධ්‍යයෙන් නිරූපණය කරයි. | • පරිසරයේ දක්නට ලැබෙන සංසිද්ධීන් ස්වභාවික හා නිර්මිත | 10 |
| | 3.2 ගැමි නාටකයන්හි එන චරිත නිරූපන ඉදිරිපත් කරයි. | • ගැමි නාටක ආශ්‍රිත චරිත<br>කෝළම් - ජස , මුදලි , නොංචි<br>සොකරි - සොකරි, ආඩිගුරු, පරයා | 12 |
| | 3.3 දේශීය නර්තන සම්ප්‍රදායයන් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | • අවස්ථා නිරූපනයට උචිත නර්තන නිර්මාණ යක්ෂ චරිතයක්, මහලු චරිතයක්, දිය නාන ස්ත්‍රියක්, තාල රූප ඇසුරින් සත්ත්ව චරිත | 10 |
| 4.0 නර්තනය හා බැඳි ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක ව තොරතුරු ඉදිරිපත් කරයි. | 4.1 නර්තනයේ ඓතිහාසික හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • නර්තන කලාවේ ප්‍රභවය හා විකාශනය<br>• දේශීය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම<br>• වන්නම් පිළිබඳ තොරතුරු<br>• ගැමි නැටුම් පිළිබඳ තොරතුරු | 06<br>06<br>08<br>06 |
| | 4.2 දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්ම පිළිබඳ ව අධ්‍යයනය කරයි. | • කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව තුලනාත්මක ව<br>• සන්නියකුම<br>• බලි ශාන්තිකර්මය | 08<br>06<br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 4.3 භාරතීය නර්තන සම්ප්‍රදායයන් හා සම්බන්ධ තොරතුරු අධ්‍යයනය කරයි. | • භරත, කථක්, කථකලි , මණිපුරි නර්තන සම්ප්‍රදායයන්ට ආවේණික සංගීත සම්ප්‍රදාය, වාද්‍ය භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ, අංග රචනය, නර්තන අංග සහ මුද්‍රා භාවිතය | 16 |
| | 4.4 නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් අගය කරයි. | • ප්‍රේමකුමාර එපිටවෙල, විල්සන් ඔලබොඩුව, මිරැන්ඩා හේමලතා, පනී භාරත, රද්දැල්ලේ පොඩි මහත්තයා | 06 |
| 5.0 නර්තන කලාකෘතීන්හි සෞන්දර්යාත්මක වටිනාකම් විචාරාත්මක ව අගය කරයි. | 5.1 සාම්ප්‍රදායික නර්තනය හා බැඳි කලාංග විචාරයට ලක්කරයි. | • සන්නියකුම ශාන්තිකර්මයෙහි රංග වස්ත්‍රාභරණ, සැරසිලි, රංග භාණ්ඩ | 14 |
| | 5.2 දේශීය මුද්‍රා නාට්‍යයන්හි කලාත්මක ලක්ෂණ විචාරයට ලක්කරයි. | • කරදිය මුද්‍රා නාට්‍යය | 14 |
| 6.0 නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 6.1 දේශීය නර්තන කලාවෙහි පෝෂණයට අනෙකුත් කලාවන්ගෙන් ලැබෙන පිටිවහල පිළිබඳ කරුණු දක්වයි. | • සංගීත කලාවෙන් ලැබෙන පිටිවහල දේශීය හා විදේශීය | 08 |
| | 6.2 නර්තන රංග වස්ත්‍රාභරණ ආකෘති නිර්මාණය කරයි. | • සාම්ප්‍රදායික රංග ආභරණ කට්ටලයක් | 16 |

## 3.0 විෂය නිර්දේශය
### 3.2 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.0 නර්තනය හා බැඳි මූලධර්ම හා ශිල්පීය ධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 1.1 සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | උඩරට නර්තන සම්ප්‍රදාය | |
| | | • මුසලඩි,සුරපති,මයුරා යන වන්නම් සම්පූර්ණයෙන් | 16 |
| | | • කුඳ කුජි ගත වට්ටම සහ ගොග් ගොග් ජිං ජිං ගත වට්ටම පද හතරක් කස්තිරම් , අඩව් සමඟ | 14 |
| | | • අස්නෙ නැටුම - ආරම්භයේ සිට දොංත තදොං තදොං රුඳ ගජිං කොටස අවසානය දක්වා | 14 |
| | | • යක් ඇනුම පළමු වට්ටම - තකුඳං දක්වා | 14 |
| | | • ආවැන්නුම - ගත් තත් ජිං කුඳ කස්තිරම සහිත ව | 10 |
| | | • බුලත් පදය | 10 |
| | | පහතරට නර්තන සම්ප්‍රදාය | |
| | | • සින්දු වන්නම් - හවාදී තාලය, කොණ්ඩනාවෙච්චි තාලය, ශුද්ධ තාලය | 12 |
| | | • සියපදය | 04 |
| | | • ආරම්භය සමඟ දෙවොල් පද තුනක් | 14 |
| | | • ශුද්ධ මාත්‍රය | 14 |
| | | • යහන් දැක්ම | 12 |
| | | • මගුල් රාගය | 12 |
| | | • දුම්මල පදය | 10 |
| | | සබරගමු නර්තන සම්ප්‍රදාය | |
| | | • වන්නම් - තිසරා, මේඝ, නාග ගජගා | 16 |
| | | • යාදිනී මාත්‍රය, සින්දු මාත්‍රය | 14 |
| | | • තොරන් යාගය | 12 |
| | | • යහන් දැක්ම | 12 |
| | | • මුදුන් තාලය මුල් වට්ටම | 12 |
| | | • දළුමුර පාලිය | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.2 නර්තනය හා බැඳි තාල ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | • ප්‍රස්තාරකරණය - ඉගෙන ගන්නා නර්තන හා ගායන | 16 |
| | 1.3 නියමිත නාදමාලාවන්ට අනුව සාම්ප්‍රදායික හා ගැමි ගායනා ඉදිරිපත් කරයි. | • ඉගෙන ගන්නා නර්තන හා බැඳි ගායනා<br>• නමස්කාර ගාථා, අෂ්ඨක, කඩතුරා කවි, හත් අඩියේ කවි, රටයකුමෙහි නානුමුරයේ කවි, කොහොඹා හැල්ල, මඩුපුරයේ කවි, කුමාර සමයමේ කවි, බඹර කවි, ටීකා සීපද | 14<br>20 |
| | 1.4 වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම භාවිත කරමින් වාදන ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | • බෙර/දවුල් සරඹ 4-6 දක්වා<br>• අදාළ වන්නම් /සින්දු වන්නම්වලට අයත් බෙරපද, අලංකාර පද (ගායනය සමඟ) කස්තිරම් /කලාසම්/ඉරට්ටි | 10<br>20 |
| 2.0 නර්තනය හා බැඳි මූලධර්ම සහ සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගික ව භාවිත කරයි. | 2.1 භාරතීය නෘත්‍ය නාටක සංකල්පය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි. | • භාරතීය නෘත්‍ය නාටක සංකල්පය | 06 |
| | 2.2 සාම්ප්‍රදායික රඟ මඬල සහ නූතන වේදිකාව පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි. | • රංග භූමි හා රංග භූමි අලංකරණය<br>• වෙස් මෝස්තර<br>• විදුලි ආලෝකනය හා වර්ණ | 06<br>06<br>06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 3.0 විවිධ අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන කලාකෘති නිර්මාණය කරයි. | 3.1 ශාන්තිකර්මයන්හි එන චරිත නිරූපණ ඉදිරිපත් කරයි. | • ශාන්ති කර්ම ආශ්‍රිත චරිත රටයකුමේ නානුමුරය/ සූනියමේ වඩිගපටුන සබරගමු වෙඩි සන්නිය/ අඹ විදමන | 10 |
| | 3.2 කෙටි ඒකාංග මුද්‍රා නාට්‍යයක් නිර්මාණය කරයි. | • චරිත කිහිපයක් ඇති සිද්ධියක් | 12 |
| 4.0 නර්තනය හා බැඳි ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 4.1 නර්තන කලාවේ නව ප්‍රවණතා විස්තර කරයි. | • දේශීය නර්තන කලාවේ නව ප්‍රවණතා | 08 |
| | 4.2 දේශීය වාද්‍ය භාණ්ඩ සාමාජයීය අවශ්‍යතා සඳහා යොදාගැනීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි. | • භාවිත අවස්ථා | 06 |
| | 4.3 දේශීය නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්මයන්හි විද්‍යමාන වන සමාජ සම්බන්ධතා පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි | • කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව, සන්නියකුම | 12 |
| | 4.4 භාරතීය හා බටහිර නර්තන සම්ප්‍රදායයන්හි ප්‍රභවය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි. | • බැලේ නාට්‍යයේ ප්‍රභවය හා විකාශනය<br>• භාරතීය නර්තනයේ ප්‍රභවය හා විකාශනය (භරත නාට්‍යම්, කථක්, කථකලි, මණිපුරි) | 06<br>16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.0 නර්තන කලාකෘතීන්හි සෞන්දර්යාත්මක වටිනාකම් විචාරාත්මක ව අගය කරයි. | 5.1 ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන නර්තන අංගයන්හි කලාත්මක ලක්ෂණ පිළිබඳ ව අදහස් දක්වයි. | • රූපවාහිනී මාධ්‍යයෙන් දකනට ලැබෙන නර්තන අංග | 08 |
| | 5.2 දේශීය මුද්‍රා නාට්‍යයන්හි කලාත්මක ලක්ෂණ විචාරයට ලක්කරයි. | • නල දමයන්ති | 10 |
| 6.0 නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 6.1 දේශීය නර්තන කලාවෙහි පෝෂණයට අනෙකුත් කලාවන්ගෙන් ලැබෙන පිටිවහල පිළිබඳ කරුණු දක්වයි. | • චිත්‍ර කලාවෙන් ලැබෙන පිටිවහල වර්ණ, රේඛා, හැඩතල,, ඇඹීම්, නෙළීම්, කැටයම් | 10 |
| | 6.2 නර්තන රංග වස්ත්‍රාභරණ ආකෘති නිර්මාණය කරයි. | • සාම්ප්‍රදායික නරතනයේ දී භාවිතයට ගනු ලබන රංග වස්ත්‍ර ආකෘති | 16 |
| | | • ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු | |

## 4.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපා

6 වන ශ්‍රේණියේ සිට නර්තන විෂය හදාරන ශිෂ්‍යයා අනාගත වෘත්තීය ජීවිතය ඉලක්ක කොට අ.පො.ස උසස් පෙළ සඳහා විෂයයක් වශයෙන් නර්තන විෂය තෝරාගනු ලබයි. එහෙයින් නර්තන විෂය හා බැඳි සුවිශේෂ කරුණු මෙන් ම ගැඹුරු විෂය කරුණු තාර්කික ව, විමර්ශනාත්මක ව සහ තුලනාත්මක ව හැදෑරීමට ශිෂ්‍යයාට අවස්ථාව සලසා දීම අත්‍යාවශ්‍ය වේ. පන්ති කාමරය තුළ මෙන් ම පාසල් පරිසරයෙන් පිටත ලෝකයේ දී ශිෂ්‍යයාට තමා හදාරන විෂය හා බැඳි සංකල්ප, සිද්ධි හා විෂය කරුණු අධ්‍යයනයට මගපෙන්විය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය ඉගෙනුම් ක්‍රම හඳුන්වාදීම කෙරෙහි ගුරුවරයාගේ අවධානය යොමු විය යුතු ය.

උසස් පෙළ විෂය නිර්දේශය ආවරණය කළ ශිෂ්‍යයා ප්‍රායෝගික ව නර්තනය, ගායනය, වාදනය පිළිබඳ කුසලතා පූර්ණ අයෙකු බවට පත්විය යුතු ය. එහිදී සාක්ෂාත් විය යුතු නිපුණතා සාධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි ගුරුවරයා විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය.

නිර්මාණකරණයේ දී ශිෂ්‍ය පරිකල්පන ඥානය වර්ධනය සඳහා පරිසර නිරීක්ෂණය මෙන්ම එදිනෙදා ජීවිතයේ දී මුහුණපාන සිද්ධි හා විවිධ අත්දැකීම් අධ්‍යයනයට යොමු කිරීම ඉතා වැදගත් වේ. එසේම විවිධ මාධ්‍ය වැඩසටහන් අධ්‍යයනය හා විචාරයට අවස්ථාව සැලසීම මගින් නර්තන විෂය හා විවිධ සන්නිවේදන මාධ්‍යයන් අතර මෙන් ම නර්තන විෂය හා විවිධ විෂයයන් අතර ඇති සහසම්බන්ධතාවය කෙරෙහි ශිෂ්‍ය සංවේදීතාව වර්ධනය වේ. එමගින් ශිෂ්‍යයාට අනාගත වැඩලෝකයේ කටයුතුවලදී පහසුවක් සැලසෙනු අත.

නර්තන විෂය ජීවිතයට අදාළ කර ගැනීමේ විවිධ මාවත් විමසා බැලීම සහ එහි ඇති වටිනාකම මෙන් ම පාරම්පරික ලක්ෂණ ආරක්ෂා කරගනිමින් පවත්වාගෙන යාම සඳහා නර්තනය ජන ජීවිතය හා බැඳී ඇති ආකාරය හා එසේ බැඳී ඇති අවස්ථා අධ්‍යයනයට සහ ගවේෂණයට මග සැලසීම කළ යුතු වේ. ඒ සඳහා ගුරුවරයා විශේෂ අවධානයකින් යුතු ව කටයුතු සැලසුම් කිරීම අවශ්‍ය වේ.

ඒ ඒ අවස්ථාවන්හි ගැලපෙන ඉගෙනුම් ක්‍රම විමසා බලා හඳුන්වාදීම සහ ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා සංවිධානය කිරීම සඳහා ගුරුවරයාට නිදහස ඇත. එහි දී සංවාද, සාකච්ඡා, නිරීක්ෂණ, ගවේෂණ, ක්ෂේත්‍ර අධ්‍යයන, ප්‍රදර්ශන, සංදර්ශන, ව්‍යාපෘති , අභ්‍යාස, අනුකරණ ආදී වූ විවිධ ක්‍රමවේදයන් භාවිත කළ හැකි ය.

## 5.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

නර්තන විෂය නිර්දේශය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී නිපුණතා පාදක ක්‍රියාකාරකම් මගින් අධ්‍යයන අවස්ථා උදාකර දීම ට සැලසුම් කොට ඇත. අපේක්ෂිත නිපුණතා සාක්ෂාත් කර ගැනීමේ දී නිර්දේශිත විෂයමාලාවට අමතර ව, පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබන විෂය සමගාමී ක්‍රියාකාරකම් මහත් පිටිවහලක් වනු ඇත. මෙහිදී ප්‍රදර්ශන, සංදර්ශන, තරග, ව්‍යාපෘති, කලා සංගම්, පුස්තකාල විමර්ශන ආදි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම අවධාරණය කෙරේ.

නර්තන නිර්මාණකරණයේ දී පරිසර නිරීක්ෂණය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සැලකේ. පරිසරයේ විවිධ සංසිද්ධීන් කෙරෙහි ශිෂ්‍යයා සංවේදී පුද්ලයකු කිරීමට අවශ්‍ය පසුබිම පාසලේදී සකස් කළ යුතු ය. ඒ සඳහා නිරීක්ෂණ චාරිකා, කලා නිර්මාණ හා කලා මධ්‍යස්ථාන අධ්‍යයන චාරිකා, විෂය කරුණු ගවේෂණ චාරිකා සංවිධානය කිරීම ඉතා වැදගත් වේ.

මිනිස් චර්යා හැඩගැස්වීම කෙරෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් අති විශාල බලපෑමක් කරනු ලැබේ. මාධ්‍ය මගින් ප්‍රචාරය කරනු ලබන වැඩසටහන් අතුරෙන් යෝග්‍ය හරවත් වැඩසටහන් තෝරා ගැනීමට ශිෂ්‍යයාට හැකියාව තිබිය යුතු ය. ඒ සඳහා අවශ්‍ය රසඥතා වර්ධනය සහ විචාර ශක්ති වර්ධනය පිණිස විවිධ ජනමාධ්‍ය වැඩසටහන් අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයනට අවශ්‍ය පහසුකම් සලසාදීම පිළිබඳ ව පාසල් බලධාරින්ගේ අවධානය යොමුකිරීම අත්‍යවශ්‍ය වේ.

උක්ත ක්‍රියාකාරකම් හා නර්තන විෂය සන්ධාරය අතර ඇති මනා සහසම්බන්ධතාව, නර්තන විෂය හදාරන ශිෂ්‍යයාට පාසල් පරිසරය ප්‍රියජනක ඉගෙනුම් අත්දැකීම් ඇති ස්ථානයක් බවට පත්කරනු ඇත.

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය. මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේදී පැවැත්වේ

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සපයනු ඇත.